"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011-2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011-2092601
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

සාමාන්‍ය දුරකථන / தொலைபேசி / General Telephone 011-2093000

මගේ අංකය / எனது இல. / My No. CSWP/ADM/18-38/FI/01-2019 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date. 2019-04-24

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම්(බ.ප),
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන අභ්‍යන්තර විගණක (අභ්‍යන්තර විගණන අංශය),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/ පරිපාලන නිලධාරි,

<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/88(I), 03/2019, 02/2019, 06/2019, හා 05/2019 බස්නාහිර පළාතට අදාල කර ගැනීම.</u>

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/02/19/01/2019 හා 2019.04.18 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත.(එම චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත.)

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/88(I), 2019-01-29 | ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන්, රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන/ නිත්‍ය වශයෙන් ආබාධිත වන රජයේ නිලධරයන්ට/ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ට/ රාජ්‍ය සංස්ථා සේවකයන්ට වෛද්‍යාධාර දීමනා/ වන්දි ගෙවීම සහ ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් මරණයට පත්වන එවැනි නිලධරයන්ගේ/ සේවකයන්ගේ යැපෙන්නන්ට වන්දි ගෙවීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2019, 2019.02.20 | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2019, 2019-02-22 | සම්පූර්ණ වැටුප් සහිතව ලබා ගත් නිවාඩුවක අනිවාර්ය සේවා කාලයක් තුළ සේවය කරමින් සිටින නිලධරයකුට වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබා දීම |

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 04. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2019, 2019-02-27 | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන අනුව ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ වගන්ති සංශෝධනය කිරීම |
| 05. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 05/2019, 2019.03.05 | දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තිය සංශෝධනය කිරීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙසත් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එම්.එන්. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),

අත්/කළේ.: ප්‍රදීප් යසරත්න.
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 21/88(I)

මගේ අංකය : EST-7/COMPT/02/3000/4
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2019.01.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන්, රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන/ නිත්‍ය වශයෙන් ආබාධිත වන රජයේ නිලධරයන්ට/ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ට/ රාජ්‍ය සංස්ථා සේවකයන්ට වෛද්‍යාධාර දීමනා/ වන්දි ගෙවීම සහ ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් මරණයට පත්වන එවැනි නිලධරයන්ගේ/ සේවකයන්ගේ යැපෙන්නන්ට වන්දි ගෙවීම</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1988.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/88 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එහි 2(ආ) ජේදයේ “III” ලෙස පහත කරුණු ඇතුළත් කිරීමට 2018.06.05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

III. “යුදමය කටයුතු හේතුවෙන් තුවාල ලබා ආබාධිතව වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත විශ්‍රාම ගන්වා සිටිය දී, වයස අවුරුදු 55 සපිරීමට පෙර පහත දැක්වෙන හේතූන් මත (නීති විරෝධී ක්‍රියාවක යෙදීමෙන් සිදු වූ මරණයක් බවට පරීක්ෂණ මගින් තීරණය කරනු ලබන මරණයක දී හැර) මියයන ශ්‍රී ලංකා පොලිස් නිලධරයකුගේ යැපෙන්නන් සඳහා නිලධරයාගේ වයස අවුරුදු 55 සපිරෙන තෙක් ඉහත 01 හි පරිදි වැටුප් හා දීමනා ගෙවිය යුතුය.”

යුද්ධයේ දී තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත් වූ පසුව එම තුවාලවල අතුරුඵලයක් හේතුවෙන් මියගිය බවට මරණ පරීක්ෂණයේ දී තීරණය වන ශ්‍රී ලංකා පොලිස් නිලධරයකු

හෝ,

යුද්ධයේ දී තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත් වූ පසුව එම ආබාධ සඳහා ලබාගන්නා ඖෂධවල අතුරුඵලයක් හේතුවෙන් මියගිය බවට මරණ පරීක්ෂණයේ දී තීරණය වන ශ්‍රී ලංකා පොලිස් නිලධරයකු

හෝ,

යුද්ධයේ දී තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත් වූ පසුව එම තුවාල හෝ එම තුවාල සඳහා ලබාගන්නා ඖෂධ හේතුවෙන් ඇතිවන මානසික පීඩනය මත සිදු කර ගත් සියදිවි නසාගැනීමක් බවට මරණ පරීක්ෂණයේ දී තීරණය වන ශ්‍රී ලංකා පොලිස් නිලධරයකු

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය